මධ්‍යම විසර්ජන ගිණුම් තුන පිළිබඳ අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩ සටහනේ (අ.ආ.ස.වැ) ඒකාබද්ධ වැඩසටහන - 2013

-----------------------------------------------------------------------------------------------------------------------

අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහනේ (අ.ආ.ස.වැ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී ලංර) හා ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2013 අගෝස්තු 19 දින එළඹි අංක 3008 එස්ආර්අයි සාමාන්‍ය මෙහෙයුම් සහ අංක 3009 එස්ආර්අයි විශේෂ මෙහෙයුම් ණය ගිවිසුම්වල iv ව්‍යවස්ථාවේ 4.04 වගන්තියේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ණය ගිවිසුම් අනුව, වැඩ සටහනේ කටයුතු අධ්‍යාපන අමාත්‍යාංශය (අ.අමා), විභාග දෙපාර්තමේන්තුව (විදෙ) සහ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව (අප්‍රදෙ) ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක කිරීමට හා, පළාත් සභා පළාත් මට්ටමෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. අධ්‍යාපන අමාත්‍යාංශය, අධ්‍යාපන දෙපාර්තමේන්තුව සහ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් ජාතික මට්ටමේන් සිදුකරන ලද කටයුතුවලට අදාළ අදහස් දැක්වීම්වලින් මෙම වාර්තාව සමන්විත වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------------------

ණය ගිවිසුම් අනුව, දිවයිනේ සාමාන්‍ය අධ්‍යාපන අංශයේ අභියෝගවලට ආමන්ත්‍රණය කිරීම සඳහා අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව සහ වැඩ සටහන (අඅසර) ක්‍රියාත්මක කිරීමට මූල්‍ය සහාය සැපයීම උදෙසා, අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ. අධ්‍යාපන අමාත්‍යාංශය, අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව සහ වැඩසටහන අනුව, ප්‍රාථමික හා ද්විතීය අධ්‍යාපනයට සමාන ප්‍රවේශය වැඩි කිරීම, ප්‍රාථමික හා ද්විතීය අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම සහ අධ්‍යාපනයේ යහපාලනය හා සේවා සැපයීම් ශක්තිමත් කිරීම වැඩසටහනේ අරමුණු වේ. ණය ගිවිසුම් අනුව, වැඩ සටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 200 කි. 2013 අගෝස්තු 23 දින වැඩසටහනේ කාර්යයන් ආරම්භ කරන ලද අතර 2018 අගෝස්තු 31 දින වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

--------------------------------------------------------------------------------------------

අධ්‍යාපන අමාත්‍යාංශයේ, විභාග දෙපාර්තමේන්තුවේ සහ අධ්‍යපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම්වල සංග්‍රහයක් වූ මෙම එකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත්, යෝග්‍ය මුදල් රෙගුලාසි සහ මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ තෝරාගැනීම හා යොදා ගැනීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

---------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තාව පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදි. ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තාවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය වාර්තාවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම් වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂාකිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩ සටහන කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩ සටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් හා ණය දෙනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද අධ්‍යාපන අංශයේ මධ්‍යම ආයතන තුනෙහි වියදම, මූල්‍ය සහ භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වාගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල නියමකර ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ අධ්‍යාපන අංශයේ මධ්‍යම ආයතන තුනේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා මුදල් රෙගුලාසි (මුරෙ) 150 සහ 2012 නොවැම්බර් 26 දිනැති අංක.227/2012 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුකූලව පිළියෙල කර තිබුණේද යන බව.

(ඊ) ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා, ආසියානු සංවර්ධන බැංකුවට පිළිගතහැකි ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කර තිබුණේද යන බව.

(උ) තැන්පත් ගිණුමේ ආරම්භක තැන්පතුව, එම ගිණුමින් ආපසු ගැනීම් හා එම ගිණුමට කරන ලද ඌන පූරණයන් මහා භාණ්ඩාගාරයේ පවත්වාගෙන යන පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහා බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) ණය ගිවිසුම්වල සඳහන් මූල්‍ය සම්මුතීන් වලට අනුකූලව කටයුතු කර තිබුණේ ද යන බව.

**3. මතය**

**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 05 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ;

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධයෙන් 2012 අංක 23 දරන විසර්ජන පනතේ පළමුවැනි උපලේඛනයේ ශීර්ෂ අංක 126 යටතේ 2013 වර්ෂය සඳහා වූ විසර්ජන ගිණුම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 150 ට සහ 2012 නොවැම්බර් 26 දිනැති අංක.227/2012 දරන මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කර තිබුණු බව සහ ඉහත සඳහන් ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා, මහා භාණ්ඩාගාරයේ පරිගණක මුද්‍රිත සටහන්, වාර්ෂික ඇස්තමේන්තු සහ අධ්‍යාපන අංශයේ මධ්‍යම ආයතන තුන විසින් පවත්වාගෙන යනු ලැබූ පොත් පත් හා වාර්තා සමඟ සැසඳී තිබුණු බව,

(ආ) තැන්පත් ගිණුමේ ආරම්භක තැන්පතුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ආපසුගැනීම් හා එම ගිණුමට කරන ලද ඌන පූරණයන්, මහා භාණ්ඩාගාරයේ පවත්වාගෙන යන පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණ බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහා බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඇ) ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි මූල්‍ය ගිවිසුමේ දැක්වෙන අවශ්‍යතාවන්ට අනුකූලව සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඇ) ණය ගිවිසුම්වල සඳහන් මූල්‍ය සම්මුතීන් වලට අනුකූලව කටයුතු කර ඇති බවත් ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

---------------

### 4.1 මූල්‍ය කාර්යය සාධනය

------------------------

ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා සහ වැඩසටහන විසින් සපයන ලද තොරතුරුවලට අනුව, සියළුම ප්‍රභවයන්ගෙන් අධ්‍යාපන අංශය සඳහා සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු.38,336,126,328 ක වියදම් දරා තිබුණි. 2013 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අධ්‍යාපන අමාත්‍යාංශයේ, විභාග දෙපාර්තමේතුන්තුවේ සහ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම් අනුව, සියළු ප්‍රභවයන්ගෙන් දරන ලද වියදම් පිළිබඳ සාරාංශයක් පහත වගුවෙන් දැක්වේ.

| විස්තරය | සමාලෝචිත වර්ෂය තුළදී සියළු අරමුදල් ප්‍රභවයන්ගෙන් දරන ලද වියදම |
|---|---:|
| | රු. |
| **පුනරාවර්තන වියදම්** | |
| පුද්ගල පඩිනඩි | 20,009,975,311 |
| වෙනත් | 10,683,336,542 |
| **ප්‍රාග්ධන වියදම්** | 7,642,814,475 |
| | 38,336,126,328 |

### 4.2 තැන්පත් ගිණුම

----------------

ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වැඩ සටහන සඳහා පවත්වා ගෙන ගිය අංක 4201 දරන තැන්පත් ගිණුමේ මෙහෙයුම් කටයුතු සාරාංශ කර පහත දැක්වේ.

| | **එජඩො.** | **රු.** |
|---|---:|---:|
| ආරම්භක තැන්පතුව | නැත | නැත |
| එකතු කළා-ඌනපූරණයන් | 40,184,329 | 5,308,209,189 |
| අඩුකළා- ආපසු ගැනීම් | 40,184,329 | 5,308,209,189 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | නැත | නැත |

## 5. විගණන නිරීක්ෂණ

--------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------

ණය ගිවිසුමේ iv ව්‍යවස්ථාවේ 4.04 වගන්තිය අනුව, ආසියානු සංවර්ධන බැංකුවට පිළිගත හැකි ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. අධ්‍යාපන අමාත්‍යාංශය, විභාග දෙපාර්තමේන්තුව හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සියළුම අරමුදල් ප්‍රභවයන්ගෙන් අධ්‍යාපන අංශයට 2013 දෙසැම්බර් 31 දිනට දරන ලද රු.38,336,126,328 ක මුළු වියදම නියෝජනය වන ඒකාබද්ධ වැඩ සටහන් වාර්ෂික මූල්‍ය වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කරන ලදී.

### 5.2 අරමුදල් උපයෝජනය

----------------------

ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා සහ විගණනයට ඉදිරිපත් කරන ලද අනෙකුත් තොරතුරුවලට අනුව, ආසියානු සංවර්ධන බැංකුවෙන් ලද ණය මුදල්, හා එයින් දරන ලද වියදම් වෙනම හෙළිදරව් කර නොතිබුණි. එසේම අධ්‍යාපන අමාත්‍යාංශයේ, විභාග දෙපාර්තමේන්තුවේ සහ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ වාර්ෂික ඇස්තමේන්තුවල ණය යටතේ ලැබුණු මුදල් භාවිතය සඳහා වූ වෙන්කිරීම් ද වෙනම හෙළිදරව් කර නොතිබුණි. එබැවින්, වැඩසටහනට සම්බන්ධ නොමැති කාර්යයන්වලට ණය මුදල යටතේ ලද මුදල් උපයෝජනය කිරීමට ඇති හැකියාව විගණනයේදී බැහැර කළ නොහැක.

### 5.3 භෞතික කාර්ය සාධනය

----------------------------

මෙම වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් පරිදි අධ්‍යාපන අමාත්‍යාංශය, විභාග දෙපාර්තමේන්තුව සහ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සියළුම අරමුදල් ප්‍රභවයන්ගෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා 2013 දෙසැම්බර් 31 දිනට දරන ලද රු.38,336,126,328 ක මුළු වියදම නියෝජනය වන ඒකාබද්ධ වැඩසටහන්

වාර්ෂික මූල්‍ය වාර්තා 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ලෙස විගණනයට ඉදිරිපත් කර තිබුණි. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල මෙහෙයුම් කටයුතුවලට අදාළ ප්‍රධාන විගණන නිරීක්ෂණ වලින් සමහරක් පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට රු.37,358,905,000 ක් වෙන්කර තිබූ නමුත් එයින් රු36,200,228,381 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එබැවින් මුළු ඉතිරිය රු.1,158,676,619 ක් වූ අතර එයින් ප්‍රාග්ධන වියදම් සඳහා වෙන්කළ මුදලෙන් ඉතිරි වූ මුදල රු.939,912,832 ක් විය. විධිමත් සැලසුම්කරණයක් නොතිබීම, ප්‍රමුඛත්ව පදනමෙන් අවශ්‍යතා හඳුනා නොගැනීම, දේශීය හා විදේශීය අරමුදල් මුදාහැරීමට ප්‍රමාද වීම්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිම කිරීමේ ප්‍රමාදයන් වැනි හේතු නිසා සමහර ප්‍රාග්ධන වැය විෂයන් සඳහා වෙන්කළ සම්පූර්ණ මුදලම ඉතිරි වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) 2012 වර්ෂයේදී යුනෙස්කෝ ප්‍රදාන යටතේ ලද රු.2,847,579 ක මුදල භාවිතා කිරීමට පහසුවීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.3,347,579 ක අතිරේක වෙන්කිරීමක් කර තිබුණි. කෙසේ නමුත් එම ප්‍රදානය අපේක්ෂිත කාර්යයන්ට උපයෝගී කර නොගෙන 2013 දෙසැම්බර් 27 දින ආපසු යවා තිබුණි. අරමුදල් ආපසු ගෙවීමේ ගිණුම්කරණ ප්‍රතිකර්මය සාවද්‍ය ලෙස අදාළ වියදම් ශීර්ෂයට බැරකිරීමෙන් සිදුකර තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 94 අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට දරන ලද වියදම් හා බැඳීම්, එක් එක් වැය විෂය යටතේ වියදම සඳහා අමාත්‍යාංශයට කරන ලද ප්‍රතිපාදන ඉක්ම නොවිය යුතුය. කෙසේ වෙතත්, වැය විෂයයන් 34 කට කරන ලද ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා සමාලෝචිත වර්ෂය අවසානයට දරන ලද බැඳීම් ප්‍රමාණය රු.5,243,994,512 ක් විය.

(ඈ) විද්‍යාගාර 859 ක් ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී සහ ඉකුත් වර්ෂයේදී එකතුව රු.4,364,105,710 ක් වෙන්කර තිබුණු අතර, 2013 දෙසැම්බර් 31 දිනට ඉන් රු.4,106,338,371 ක පිරිවැයක් දරමින් විද්‍යාගාර 380 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි.

(ඉ) 2012 වර්ෂයේ සිට පාසැල් පදනම් කරගත් අධ්‍යාපන ප්‍රවර්ධන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කළ අතර යෝජනා ක්‍රමයේ 01 වැනි අදියර සඳහා තෝරා ගත් ජාතික පාසැල් 50 කට හා පළාත් පාසැල් 359 කට ඉකුත් වර්ෂයේදී රු.162,400,000 ක ප්‍රදාන ලබාදී තිබුණු බව නිරීක්ෂණය විය. තවද යෝජනා ක්‍රමයේ 02 වැනි අදියර යටතේ තෝරාගත් තවත් ජාතික පාසැල් 132 කට සහ පළාත් පාසැල් 466 කට සමාලෝචිත වර්ෂය තුළදී රු.89,550,000 ක ප්‍රදාන ලබා දී තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘති යෝජනා, කාලීන ප්‍රගති වාර්තා ආදිය අදාළ විදුහල්පතිවරුන් විසින් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් යෝජනා ක්‍රමයේ මූල්‍ය සහ භෞතික ප්‍රගතිය විගණනයේදී ඇගයිය නොහැකි විය.

(ඊ) අදාළ ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ නිම කිරීමට පෙර මහින්දෝදය තාක්ෂණික පීඨ 150 ක් සඳහා රු199,285,500 ක් වටිනා ලී බඩු කොන්ත්‍රාත් 06 ක් යටතේ ප්‍රසම්පාදනය කර තිබුණු බව නිරීක්ෂණය විය. එබැවින් එකී ලී බඩු විධිමත් ආරක්ෂාවකින් තොරව පාසැල් දෛනික කටයුතුවලට බාධාවන අයුරින් පාසැල් පරිශ්‍ර තුළ තබා තිබුණි. තවද ලී බඩු සැපයීමේ සමහර කොන්ත්‍රාත්තු එකඟ වූ කාල පරිච්ඡේදය තුළදී නිමකර නොතිබුණි. කෙසේ වෙතත් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට හෝ කොන්ත්‍රාත් කාල පරිච්ඡේදය දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි. මෙයට අමතරව රු.10,332,314 ක් වටිනා ලී බඩු මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර 17 ක් සඳහා ප්‍රසම්පාදනය කර තිබූ නමුත් අදාළ ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ නිමකිරීමට පෙර ප්‍රසම්පාදනයන් කර තිබීම හේතුවෙන් එම භාණ්ඩ පාසැල් පරිශ්‍ර තුළ නිෂ්කාර්යව තබා තිබුණි.

(උ) 2006 වර්ෂයේ සිට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පාසැල්වලට "School Net" නමින් වූ අන්තර්ජාල ප්‍රවේශ පහසුකම් ලබා දී තිබූ අතර පුද්ගලික සමාගමක හා රාජ්‍ය සංස්ථාවක සහාය ඇතිව රු.37,090,000 ක පිරිවැයක් දරමින් ජාලය සංවර්ධනය කර පාසැල් 1724 කට එය

සම්බන්ධ කර තිබුණි. මෙම කාර්යයෙහි නඩත්තු කටයුතු සඳහා 2006 වර්ෂයේ සිට එකතුව රු.579,140,248 ක පිරිවැයක් දරා තිබුණි. එයින් රු.222,327,173 ක් සමාලෝචිත වර්ෂය තුළදී දරා තිබුණි. පාසැල්වලින් එකතුකරගත් තොරතුරු අනුව, ජාලයේ අඩු ධාරිතාව හේතු කොට ගෙන පාසැල් 414 කට පහසුකම ලැබී නොතිබුණු බව තහවුරු විය. තවද, පිරිවැය රු.16,122,312 කට 2012 වර්ෂයේ දී ස්ථාපනය කරන ලද අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියද "School Net" පහසුකම අහෝසිකිරීම හේතු කොට ගෙන පාසැල් විසින් උපයෝජනය කිරීමෙන් තොරව පැවතුණි.

(ඌ) බස්නාහිර පළාතේ විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයන් සඳහා ජාතික සන්නිවේදන මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.56,000,000 ක වෙන්කිරීමක් කර තිබුණි. එහෙත් එය අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි. එම වෙන් කිරීමෙන් රු.8,694,366 ක් වෙනත් කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණි.

(එ) අමාත්‍ය මණ්ඩලය තීරණය කළ පරිදි එක් පන්ති කාමරයක උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 42 ක් ලෙස නිශ්චය කර තිබුණි. එහෙත් ජාතික පාසැල් 31 ක 5 වසර පන්තිවල කරන ලද විගණන නියැදි පරීක්ෂණයකට අනුව එකී නිශ්චිත සීමාව ඉක්මවා සිසුන් 1250 ක් සිටි බව අනාවරණය විය.

(ඒ) අධ්‍යාපන අමාත්‍යාංශයෙන් විගණනයට ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව විෂයයන් බොහොමයක් සඳහා 2,096 ක ගුරු පුරප්පාඩු පැවති අතර වෙනත් විෂයයන් බොහොමයක් සඳහා ගුරු තනතුරු 5,078 ක අතිරික්තයක් පැවතුණි. වාර්ෂික ගුරු මාරු පිළිබඳ විධිමත් ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම හේතුවෙන් ගුරුවරුන් පාසැල්වලට අවිධිමත්ව සේවයෙහි යොදවා තිබූ බව විගණනයේදී අනාවරණය විය.

(ඔ) විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයන්ට ඉගැන්වීමේ ඩිප්ලෝමා සුදුසුකම් සහිත ගුරු තනතුරු 476 ක් සඳහා පාසැල්වල පුරප්පාඩු පවතින බව නිරීක්ෂණය විය. තවද පාසැල් 128 ක විශේෂ අවශ්‍යතා වුවමනා වූ සිසුන් 1145 ක් සඳහා එවැනි සුදුසුකම් ලත් ගුරුවරුන් අනුයුක්ත කර නොතිබුණු බව නිරීක්ෂණය විය. එසේම විශේෂ අවශ්‍යතා වුවමනා වූ සිසුන්ට ඉගැන්වීමේ සුදුසුකම් සහිත ගුරුවරුන් 176 ක් එවැනි විශේෂ අවශ්‍යතා වුවමනා නොවූ සිසුන් සිටින වෙනත් පාසැල් 162 කට අනුයුක්ත කර තිබුණි.

(ඕ) අදාළ පාසැල්වල විදුහල්පතිවරුන් විසින් අදාළ සිසුන් පිළිබඳ තොරතුරු ඉදිරිපත්කර නොතිබීම නිසා, පහ වසර ශිෂ්‍යත්ව විභාගය සමත් කොළඹ, මහනුවර සහ මාතර පිහිටි ජාතික පාසැල් තුනකට ඇතුළත් කර තිබුණු සිසුන් 620 දෙනෙකුට එකතුව රු.1,476,000 ක ශිෂ්‍යාධාර ගෙවා නොතිබුණු බව නිරීක්ෂණය විය.